
# පෙර ආත්මය ගැන දැනගන්න

අතුල මංචනායක



යම් කෙනෙකු වත්මන් ආත්ම භාවයට පෙර ඉපිද සිටියේ යැයි අපට ස්ථිරව කිව හැකි ද? අධිමානසික විද්‍යාඥයන් හා පෙර ආත්ම ගවේෂකයන් කොතෙක් විශ්වාස කළ ද යම් කෙනෙකු මින් පෙර ද පෘථිවිය මත ජීවත්ව සිටියේ යැයි ස්ථිරව ම පැවසීමට අපට නොහැකි වුවත්, ඒ අන්දමට අප මින් පෙරද ජීවත්ව සිටි බැව් විශ්වාස කිරීම අපගේ වත්මන් ජීවිතයේ ගැටලු රාශියක් විසඳ ගැනීම සඳහා බෙහෙවින් උපකාරී වේ.

ඔබගේ වත්මන් ජීවිතය තුළ ඔබ ලබා ඇති සමාජ තත්ත්වය, පවුල් පසුබිම, හැඩරුව, ගති පැවතුම්, අධ්‍යාපන තත්ත්වය ආදී එකී නොකී සෑම කරුණක් ම ඔබගේ අතීත ආත්මභාවයන් හි දී ඔබ විසින් ම කරන ලද්ද වූ සියලු ක්‍රියාවන් හි ඵලය ලෙසින් දැකීමට පෙර ආත්මභාව පිළිබඳ විශ්වාසය අපට ඉඩකඩ සලසා දෙයි.

යම් කෙනෙකු සතු විශේෂ දක්ෂතාවක් හෝ හැකියාවක් පවුලේ වෙනත් කිසිවකුට නැති විටෙක දී ඒ අයට පමණක් ලැබුණේ කෙසේදැයි පැහැදිලි කිරීම සඳහා පෙර ආත්ම පිළිබඳ විශ්වාසයක් මත පිහිටීම ඉතා පහසු විසඳුමක් දෙන්නක් වේ. එමෙන් ම යම් පුද්ගලයන් දෙදෙනෙකු අතර ප්‍රථම දර්ශනයේ පටන් ම ඇති වූ ස්නේහවන්ත භාවය තමන්ට විරුද්ධවාදී හැඟීමක් ද පැහැදිලි කරලීම පිණිස වෙනත් යොදගත හැකි කිසිදු උපකල්පනයක් මනෝවිද්‍යාව තුළින් සොයා ගැනීමට නොහැකි වේ. එසේත් නැත්නම් යම් කෙනෙකුගේ දෛවය පිළිබඳ ඇදහිය නොහැකි තරමේ විස්මිත සිදුවීමක් ඇති වූ විටෙක දී එය පැහැදිලි කරලීම පිණිස ද පෙර ආත්මභාවවල දී ඔහු හෝ ඇය විසින් කරන ලද කුශලාකුශල කර්ම ශක්තිය පිළිබඳ කථා කිරීමට අපට සිදු වන්නේ ය. වෙනත් කිසිදු පැහැදිලි කිරීමක් ඒ සඳහා යොද ගැනීමට නොහැකි වන බැවිනි.

ඉහත දක්වන ලද ආකාරයෙන් පෙර ආත්මයන් පිළිබඳ විශ්වාසයක් ඇතිකර ගැනීම ජීවිතය පිළිබඳව හට ගන්නා ප්‍රශ්න බොහොමයකට පිළිතුරු සෙවීමේදී පහසු අත්වැලක් වන්නේ ය. එමෙන්ම තමන්ගේ වත්මන් ජීවිතය ප්‍රබෝධමත් කර ගැනීමට මෙන්ම ආධ්‍යාත්මික ගමන් මගෙහි ඉහළ අතට ගමන් කිරීමට ද එබඳු විශ්වාසයන් බෙහෙවින් උපකාරී වන්නේ ය.

ඔබගේ වත්මන් ජීවිතය තුළ ඔබ ලබා ඇති සමාජ තත්ත්වය, පවුල් පසුබිම, හැඩරුව, ගති පැවතුම්, අධ්‍යාපන තත්ත්වය ආදී එකී නොකී සෑම කරුණක් ම ඔබගේ අතීත ආත්මභාවයන් හි දී ඔබ විසින් ම කරන ලද්ද වූ සියලු ක්‍රියාවන් හි ඵලය ලෙසින් දැකීමට පෙර ආත්මභාව පිළිබඳ විශ්වාසය අපට ඉඩකඩ සලසා දෙයි.

මේ සෑම අතකින්ම බලනවිට පෙර ආත්මභාවයන් පිළිබඳ විශ්වාසය අපට වැඩදයක අන්දමින් ප්‍රයෝජනවත් වන්නා වූ සංකල්පයක් බව ඉතා පැහැදිලිව පෙනේ. ඒ සම්බන්ධව සැකයක් ඇති කර ගැනීමට වඩා එම විශ්වාසය මත එල්බ ගැනීම ප්‍රයෝජනවත් බැවින් අප මින් පෙර ජීවත්ව සිටියේ ය යන උපකල්පනය මත රඳ පැවතීම වඩා සුදුසු යැයි සිතේ.

ඒ අනුව පෙර ආත්ම පිළිබඳ විශ්වාසය මත පිහිටා කටයුතු කරන විට පැනනගින පළමුවන කුතුහලය දනවන ප්‍රශ්නය වන්නේ අපගේ පෙර ආත්මභාව කුමන ආකාරයෙන් වී ඇද්ද යන්න ය.

වෙනත් වචනවලින් පවසන්නේ නම් අපගේ පෙර ආත්මභාව පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා වූ ආශාවන් නිතැතින් ම සිත තුළ ජනිත වීම ය.

පෙර ආත්ම තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා වන ක්‍රම කිහිපයක් අධිමානසික ක්ෂේත්‍රය තුළදී විස්තර කරනු ලැබ ඇත. ඒවායින් කිහිපයක් පහත දැක් වේ.

(1) යම් භාවනා ක්‍රමයක් පුරුදු පුහුණු කිරීමෙන් උපදවා ගනු ලබන ඥාන ශක්තිය තුළින් තමාගේ ම පෙර ආත්මභාවයන් දැකීම හෙවත් පූර්වානුස්මෘති ඥානය පහළ කර ගැනීම

(2) කිසියම් භූතාත්මයක් උපකාරයෙන් කරනු ලබන ගවේෂණයක් මගින් පෙර ආත්ම තොරතුරු ලබා ගැනීම

(3) මෝහන නිද්‍රාවකට පත් කර යටිසිතෙහි මතක ගබඩාව අවදිකර ඒ තුළින් පෙර ආත්ම තොරතුරු ලබා ගැනීම හෙවත් මෝහන ප්‍රතිගමන ක්‍රියාවලිය.

(4) තමා වෙත වත්මන් ජීවිතය තුළදී පිහිටා ඇති දක්ෂතා, ගතිපැවතුම් ආදිය මෙන් ම තමා දකින සිහින ආදිය මනෝවිශ්ලේෂණාත්මකව විග්‍රහ කර පෙර ආත්ම තොරතුරු ලබා ගැනීම වත්මන් ජීවිත අත්දැකීම් තුළින් පෙර ආත්ම පිළිබඳ තොරුතුරු දැන ගැනීමට ද මෙම අංශයට ම අයත් වේ.

ඉහත ක්‍රම අතරින් මෙම ලිපිය මගින් විස්තර කිරීමට අදහස කරන්නේ අංක 04 යටතේ දක් වූ ක්‍රමය යටතේ පෙර ආත්ම තොරතුරු ලබා ගත හැකි ක්‍රම වේ.

මෙහි පහත දක්වා ඇති ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමට ඔබ උත්සාහ ගතහොත් ඔබට ඔබගේ පෙර ආත්මභාව පිළිබඳ යම් අදහසක්, ඉඟියක් ඇති කර ගත හැකි මග ඒකාන්ත ය. මෙම ප්‍රශ්නාවලිය පිළියෙළ කරන ලද්දේ පෙර ආත්ම පිළිබඳ අධිමානසික පර්යේෂණයන්හි යෙදෙන පෙර ආත්ම ගවේෂකයකු විසිනි.

(1) ඔබ විසින් නිතර නිතර සිහින මගින් දකිනු ලබන සුවිශේෂ වූ ස්ථානයන් තිබේ ද?

(2) ඔබට කිසිදිනෙක යා යුතු නොවේයැයි හැඟෙන යම් ස්ථානයක් පිළිබඳව ඔබට යම් දැනීමක් ඇති වී තිබේ ද?

(3) ඉතිහාසය පුරා වූ ඒ ඒ කාල වකවානු අතරින් ඔබගේ සිත් වඩාත් තදින් ඇද බැඳ ගත් යම් වකවානුවක් හෝ යුගයක් පිළිබඳව ඔබට යම් සඳහනක් කළ හැකි ද?

**පෙර ආත්ම පිළිබඳ විශ්වාසය මත පිහිටා කටයුතු කරන විට පැනනගින පළමුවන කුතුහලය දනවන ප්‍රශ්නය වන්නේ අපගේ පෙර ආත්මභාව කුමන ආකාරයෙන් වී ඇද්ද යන්න ය.**

(4) ඔබ වඩාත් සතුටින් යෙදෙන්නා වූ යම් ක්‍රියාවලියක් හෝ ඔබ ඉතා කැමැත්තෙන් සහභාගී වන ක්‍රීඩාවක් හෝ වෙනත් ක්‍රියාදාමයක් ඔබට නම් කළ හැකි ද?

(5) එමෙන් ම ඔබ ඕනෑකමින් ම වැළකී සිටීමට හෝ සහභාගී නොවී සිටීමට ප්‍රිය කරන යම් ක්‍රියාවලියක් හෝ ක්‍රීඩාවක් තිබේ ද?

(6) ඔබ ජීවත් වන රටේ වූ යම් ප්‍රදේශයක් පිළිබඳව ඔබ තුළ විශේෂ කැමැත්තක් හෝ අකමැත්තක් හට ගෙන තිබේ ද?

(7) ඔබ තුළ ප්‍රථම දර්ශනය හෝ ප්‍රථම හමුවීම තුළදීම සිත් ඇද ගත් පුද්ගලයකු හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු ගැන සඳහන් කළ හැකි ද?

(8) ප්‍රථම හමුවීම හෝ ප්‍රථම දර්ශනය තුළදීම අකමැත්තක් හෝ සෘණ ආකල්පයක් ඇති කිරීමට සමත් වූ පුද්ගලයකු හෝ පුද්ගලයන් පිරිසක් ගැන ඔබට කිව හැකි ද?

(9) ඔබ තුළ යම් ක්‍රියාවක්, වස්තුවක් හෝ අවස්ථාවක් පිළිබඳව සුවිශේෂ බියක් පවතින්නේ ද?

(10) ඔබ තුළ උපතින් ම පිහිටා ඇති සුවිශේෂ දක්ෂතාවන් පිළිබඳව ඔබට කිව හැකි ද?

(11) ඔබ වඩාත් ම කැමති හෝ අකැමැති ආහාර වර්ගයක් ගැන ඔබට කිව හැකි ද?

(12) උපතේ පටන් ම ඔබ පීඩා විඳින නිතර හටගන්නා රෝගයක් ගැන ඔබට කිව හැකි ද?

(13) ඔබ කිසිදිනෙක අත් දැක නැති ස්ථානයක් හෝ සිදුවීමක් සිහිනයෙන් දැක තිබේ ද?

(14) ඔබට කිසියම් දිනෙක ඔබගේ සිරුරින් බැහැර වූ බවක් දැනී තිබේ ද? එබඳු අත්දැකීමක් සිහිනයක් තුළ දී හෝ අත් දැකීමට ලැබී තිබේ ද?

**ඉහත කී ප්‍රශ්නවලට ඔබ විසින් දෙනු ලබන අවංක පිළිතුරු මගින් ඔබගේ පෙර ආත්මභාව පිළිබඳ යම් හැඟීමක් ඇති කර ගැනීමට අධිමානසික විද්‍යා පර්යේෂකයකුට හැකි වේ. ඒ පිළිබඳ විස්තර ලබන කලාපයක දී විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි.** ❑